**ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

**-----------------------------------------------------------------------------------------**

ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජනවාරි 11 දින තැපැල්පති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**--------**

**2.1 විසර්ජන ගිණුම**

**-----------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**----------------------------**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 11,960.50 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු. මිලියන 11,952.04 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 8.46 ක් හෙවත් සියයට 0.07 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 11,759.50 | 11,755.69 | 3.81 | 0.03 |
| මූලධන | 201.00 | 196.35 | 4.65 | 2.31 |
| **එකතුව** | **11,960.50** | **11,952.04** | **8.46** | **0.07** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා අංක 20.01.02.00 දරන ආදායම් සංකේතය සඳහා රු.මිලියන 7,000.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. මිලියන 6,710.88 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 95.87 ක් වී තිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 764.95 | 609.05 | 644.95 | 704.53 | 2,200.00 | 1,659.37 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0098/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 527.95 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම**

-------------------------

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 16.53 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
| --- | --- |
| | **රු. මිලියන** |
| 6000/0000/00/0015/0162/000 | 9.42 |
| 6000/0000/00/0001/0038/000 | 0.10 |
| 6000/0000/00/0002/0049/000 | 0.01 |
| 6000/0000/00/0013/0039/000 | 0.68 |
| 6000/0000/00/0016/0002/000 | 3.93 |
| 6000/0000/00/0018/0009/000 | 2.39 |
| **එකතුව** | **16.53** |

**2.6 විගණන නිරීක්ෂණය**

-----------------------

තැපැල් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-----------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
| --- | --- | --- |
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 3.2 අග්‍රිම ගිණුම

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුම් 02 ක නොපියවූ මුදල් ශේෂය රු.454,921 ක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට නොපියවූ උප අග්‍රිම ශේෂය රු. 142,408 ක් වී තිබුණි. 2016 අගෝස්තු 31 දින වන විට ඉන් රු. 134,370 ක් පියවා නොතිබුණි.

(ඇ) 2015 නොවැම්බර් 23 දිනැති අංක 06/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය පියවිය යුතු වුවත්, 2015 දෙසැම්බර් 31 දිනට පැවැති රු.450,648,654 ක් වූ අග්‍රිම ගිණුමේ ශේෂය 2016 මාර්තු 23 දින 2016 වර්ෂයේ අග්‍රිම ගිණුමට මාරු කර තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

----------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ එකතුව රු.3,950,933 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 16 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.4 ආදායම් ගිණුම

----------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත අංක 20-01-02-00 හි ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී විභාග ගාස්තු කොමිස්, දුරකථන ආදායම් කොමිස් හා නිදහස් තැපැල් ආදායම් පාදක කරගෙන නොතිබුණි. නමුත් එම ආදායම් විෂයයන්වලින් පිළිවෙලින් රු. 2,892,957, රු. 2,162,501 ක් හා රු. 39,114,344 ක් වශයෙන් එකතුව රු.44,169,802 ක ආදායම් රැස් කරගෙන තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දින වන විට හිඟ හිටි ආදායම රු. 2,991,412 ක් වී තිබුණි. එම හිඟ හිටි ආදායම වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, 2016 අගෝස්තු 31 දින වන විටත් එම ආදායම් අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට ජාලගත කරන ලද උපකාරක සේවාවන්වලින් ලැබෙන ආදායම් විෂයයන් 06 ක ආදායම පරිගණක අංශයේ වාර්තා හා ආදායම් වාර්තාව අතර රු.80,892,440 ක වෙනස්කම් පැවතුණි.

(ඈ) 2015 වර්ෂයේ සන්නිවේදන පියස ආදායම රු.7,000,000 ක් වුවද, එය 2014 වර්ෂයේ රු.44,184,797 ක් වුයෙන් ආදායම රු.37,184,797 කින් එනම් සියයට 84.16 කින් අඩු වී තිබුණි.

(ඉ) 2015 වර්ෂයේ සන්වේදන පියස් ආදායම ලෙස රු.7,000,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ලැබීම් හා ගෙවීම් ගැලපීමෙන් පසුව වූ ශේෂයෙන් මුදලක් තැපැල්පතිගේ ආදායම් ගිණුමට මාරු කර තිබුණි. ඒ අනුව මෙම ආදායම මාරු කිරීමේ නිශ්චිත වූ ක්‍රමවේදය පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි බැවින් සන්නිවේදන පියස්වල ආදායම නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි විය.

(ඊ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාර, නිසි ලෙස පිළියෙල කළ ත්‍රෛමාසික ආදායම් වාර්තා එම කාලසීමාව අවසන් වූ දින සිට දින 15 ක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 30801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණ ශේෂවල එකතුව රු. 67,557,186 ක් වූ අතර එම හිඟ හිටි ශේෂයෙන් රු. 50,099,550 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 34 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව රජයේ සේවකයකු සඳහා ගෙවිය හැකි සමස්ථ ආපදා ණය ප්‍රමාණය රු. 250,000 කට සීමා කර තිබුණද, අවස්ථා 09 කදී නිලධාරීන්ට එම සීමාව නොසලකා ආපදා ණය ගෙවා තිබුණි.

(ඇ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ණය ශේෂයන්ගේ එකතුව හා දිසා ගිණුම් පාලන ගිණුමේ ශේෂ අතර රු. 1,221,203 ක වෙනසක් පැවතුණි.

(ඈ) මධ්‍යම තැපැල් හුවමාරුවේ සේවක ණය ලේඛනවල හා ගිණුමේ ශේෂ නොසැසඳුනු අවස්ථා 37 ක් නිරීක්ෂණය විය. එම වෙනස්කම්වල එකතුව රු. 892,393 ක් වී තිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබාගැනීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 201 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 155 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අදාළ තොරතුරු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 දෙසැම්බර් 31 දිනට නාරාහේන්පිට මුද්දර සුරක්ෂිතාගාරයේ රු. 308,947,810 ක වටිනාකමකින් යුතු මුද්දර /සිහිවටන පත්‍රිකා 12,049,049 ක් හා මුහුණත වටිනාකම සඳහන් නොවන රාජතාන්ත්‍රික මුද්දර 616,000 ක් නිෂ්ක්‍රීයව පැවතුනි.

(ii) ගබඩාවේ එකතුව රු.9,131,734 ක් වටිනා මුද්දර කවර, මුල්දින කවර, සුභ පැතුම්පත්, විවිධ දැනුවත් කිරීමේ පොත්, ලිපි ද්‍රව්‍ය හා මුද්දර පොත් නිෂ්ක්‍රීයව පැවතුණි

(iii) මධ්‍යම තැපැල් හුවමාරුවේ මෝටර් රථ 06 ක් ගාල්කර තැබීම සම්බන්ධයෙන් 2015 සැප්තැම්බර් 23 දිනැති විගණන විමසුමෙන්, විමසා තිබුණි. 2015 දෙසැම්බර් 29 දිනැති තැපැල්පතිවරයාගේ පිළිතුරු ලිපියට අනුව තැපැල් ප්‍රවාහන අංශයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙසේ ගාල්කර ඇති බවත්, එයින් වාහන 03 ක් වාහන දීමනාව ලබාගන්නා නිලධාරීන් වෙනුවෙන් රඳවා ගෙන ඇති බවත් දැනුම් දී තිබුණි. තවද වාහන 04 ක් අතිරික්ත බවට 2015 ජූලි 07 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වා යැවූ ලිපියේ පිටපතක්ද ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද මෙම වාහන 2016 ජූලි 26 දින වන විටත් එම පරිශ්‍රයේ එම වාහන නිෂ්කාර්යව රඳවා ගෙන තිබුණි.

(iv) වෑන් රථ 02 ක් 2016 ජූලි 26 දින වන විට මධ්‍යම තැපැල් හුවමාරු පරිශ්‍රයේ නිෂ්කාර්යව ගාල්කර තිබුණි.

(v) මෝටර් රථයක් මධ්‍යම තැපැල් හුවමාරුවේ දිරාපත් වෙමින් පැවතුණි. මෙම වාහනය තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයට අයත් බවට පිළිතුරු ලබාදුන්නද එය එම අමාත්‍යාංශයටද අයත් නොවන බව නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තාව 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කොළඹ, කළුතර, මන්නාරම, කෑගල්ල තැපැල් අධිකාරී කොට්ඨාශවල 2016 අගෝස්තු 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

---

වැය විෂයයන් 16 කට අදාළව සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය වියදම් කල පසු ඉතිරිය ඉක්මවා රු. 81,704,624 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.8 අනුකූල නොවීම්**

---

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම |
| --- | --- | --- | --- |
| **(අ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | අපහරණය කළ යුතු වාහන චක්‍රලේඛයේ දින සිට මාස 03 ක් ඇතුළත අපහරණය කර අවසන් කළ යුතු වුවත් වාහන 07 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි අතර මෙයින් වාහන 05 ක කොටස් සොරාගෙන තිබුණි.<br><br>2016 මාර්තු 01 දින සිදුකරන ලද වෙන්දේසියේදී ඉල්ලුම් නොකළ අපහරණය කළ යුතු වාහන සංඛ්‍යාව 09 ක් විය. |
| | (ii) | 2015 ජුලි 10 දිනැති අංක 2/2015 දරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාවන් මාස 06 කට වරක් සිදු කර නොතිබුණි. |
| **(ආ)** | **තැපැල්පතිගේ චක්‍රලේඛ** | | |
| | (i) | 2000 නොවැම්බර් 07 දිනැති අංක 14/2000 දරන චක්‍රලේඛය | (i) 2016 අප්‍රේල් 30 දින වන විට ක්‍රියාත්මක වූ තැපැල් සන්නිවේදන පියස් 46 හි මාසික මූල්‍ය වාර්තා එළඹෙන මාසයේ 10 දිනට ප්‍රථම එහි පිටපතක් තැපැල්පති වෙත ඉදිරිපත් කර නොතිබුණි.<br><br>(ii) සන්නිවේදන පියස්වල සෑම මාසයක් අවසානයේදී ලාභ ලාභ ගිණුමක් පිළියෙල කර ලාභය/අලාභය හඳුනාගෙන නොතිබුණි. |
| | (ii) | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඡේදය 06 | දිසා ගිණුම් කාර්යාලය පවත්වාගත යුතු මුදල් ගිණුම, ප්‍රාග්ධන ගිණුම, ගැණුම් ගිණුම, තොග ගිණුම, ආදායම් ගිණුම, විකුණුම් ගිණුම, පොදු කාර්ය පිරිවැය ගිණුම, ස්ථාවර වත්කම් ගිණුම යනාදී ලෙජර් ගිණුම් ගාල්ල හා මාතර සන්නිවේදන පියස් විසින් පවත්වා නොතිබුණි. |
| | (iii) | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඡේදය 7 | සෑම වසරක් අවසානයේදීම සන්නිවේදන පියසේ මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය හෙළිදරව් වන පරිදි ලාභ අලාභ ගිණුම හා |

ශේෂපත්‍රය සකස් කළ යුතු වුවත්, මාතර හා ගාල්ල සන්නිවේදන පියස්වල 2002 වර්ෂයේ සිට එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(iv) ඉහත සඳහන් චක්‍රලේඛයේ ඡේදය 8 — සන්නිවේදන පියස්හි පැවැත්විය යුතු ගිණුම් පොත්පත් ලිපිගොනු හා ලේඛන ගාල්ල හා මාතර සන්නිවේදන පියස්වල පවත්වා නොතිබුණි.

**3.9 කාර්යසාධනය**

----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

----------------------------------------------------

තැපැල් දෙපාර්තමේන්තුව විසින් උපයන ලද ආදායම හා වියදම, ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2014 | 2015 | වැඩිවීම | වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| ආදායම | 6,557 | 6,711 | 154 | 2.35 |
| වියදම | 9,541 | 11,756 | 2,215 | 23.22 |
| මෙහෙයුම් උනතාවය | 2,984 | 5,045 | 2,061 | 69.07 |

(i) පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමස්ථ ආදායම සියයට 2.35 කින් වැඩිවී තිබුණද, මෙහෙයුම් ඌනතාවය සියයට 69.07 කින් වැඩිවී තිබුණි. ඒ සඳහා වියදමේ වැඩිවීම බලපා තිබුණි.

(ii) තැපැල් දෙපාර්තමේන්තුව දිගින් දිගටම අලාභ ලැබීම වලක්වා ආදායම හා වියදම සම තත්ත්වයේ පවත්වා ගැනිමේ අරමුණින් තැපැල් කාර්යාල ජාලගත ව්‍යාපෘතිය 2007 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව ඉකුත් වර්ෂයේදි ලබා ගෙන තිබුණු රු.මිලියන 2,061 ක ඌනතාවයද ඉක්මවා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.මිලියන 5,045 ක් දක්වා වැඩි වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ රු.මිලියන 23.28 ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) 2015 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් නොකළ එකතුව රු.මිලියන 23.74 ක් වටිනා ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක කර තිබුණි.

**3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-------------------------------------**

**ගැලපුම් කළ යුතු ශේෂ**

**-------------------------**

ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුමක වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට පැවැත එන හඳුනා නොගත් රු. 50,000 ක් 2016 අගෝස්තු 31 දින වනවිටත් නිරවුල් කර නොතිබුණි.

**3.11 අවිධිමත් ගනුදෙනු**

**-------------------**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**-----------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) ජනාධිපතිවරණය සඳහා භිස් පොලිසැක් මළු 115,000 ක් රු. 6,954,200 කට සපයා ගැනීම:**

**---------------------------------------------------------------------------------**

සුදු හා රතු පාට ලොකු පොලිසැක් මළු පිළිවෙලින් 4,000 ක් හා 15,000 ක් ද, සුදු හා රතු පොඩි පොලිසැක් මළු 30,000 ක් බැගින් 60,000 ක් ද, සපයා ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් 06 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 08 දින ලංසු කැඳවා තිබුණි. ඒ සඳහා ආයතන 04 කින් ලංසු ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව ගිවිසුමකට එළඹ නොතිබුණු අතර 5.4.10 මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙනද නොතිබුණි.
- ජනාධිපතිවරණ අවශ්‍යතාවයන් සඳහා විවෘත මිල ගණන් කැඳවිමකින් තොරව සීමිත මිල ගණන් යටතේ ලංසු කැඳවීමට තීරණය කර තිබුණි. පොලිසැක් මළු නියමිත දිනවලට සපයා නොතිබුණ අතර එම සැපයීම් 2015 ඔක්තෝබර් මාසය අවසාන වන විටත් සිදුකර තිබුණි.
- ලංසු සුරක්ෂණය තැපැල්පති නමින් ඉදිරිපත් නොකළ ආයතනයක් විසින් ලොකු සුදු පාට පොලිසැක් මල්ලක් සඳහා රු.44.50 කට සැපයීමකට ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. එය හේතුකොට ගෙන මූලික ඇගයීමෙන් එම ලංසුකරු ඉවත් කර රු.77.11 බැගින් මළු 40,000 ක් මිලදී ගැනීමට 2014 දෙසැම්බර් 12 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

**(ii) සවල් මළු 8,500 ක් සපයා ගැනීම**

---------------------------------------

2015 පාර්ලිමේන්තු මැතිවරණයේ ඡන්ද පත්‍රිකා බෙදා හැරීමේ කටයුතු සඳහා සවල් මළු 8,500 ක් මිලදී ගැනීමට 2015 ජූලි 06 දින රාජ්‍ය සංස්ථාවකින් පමණක් ඍජු මිලදී ගැනීම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මැතිවරණ කටයුතු සඳහා මිලදී ගැනීමක් ලෙස සඳහන් කළ ඉහත ප්‍රසම්පාදනයට අදාළ සවල් මළු සැපයීම සංස්ථාව විසින් 2015 අගෝස්තු 06 දිනට පෙර සැපයීම් කළ යුතු වුවත්, 2015 අගෝස්තු 25 දින වන විටත් සපයා නොතිබුණි.

- නියමිත භාණ්ඩ ප්‍රමාණය සැපයීමට අපොහොසත්වීම මත, 2015 අගෝස්තු 11 දින එම කොන්ත්‍රාත්තුව අවලංගු කරන බවත්, කාර්යසාධන බැඳුම්කරය පවරා ගන්නා බවත්, රාජ්‍ය සංස්ථාව වෙත දන්වා තිබුණි. 2015 අගෝස්තු 26 දින සවල් මළු 5,047 ක් නාරාහේන්පිට ගබඩාවට අදාළ සැපයුම්කරු විසින් භාරදී තිබුණි. මෙහිදී සියයට 1 ක ප්‍රමාද ගාස්තුවක් පමණක් අයකර කාර්යසාධන බැඳුම්කරය අවලංගු නොකිරීමට තීරණය කර තිබුණි.

- මැතිවරණ අවශ්‍යතා වෙනුවෙන් ඍජු මිලදී ගැනීමට තීරණය වූ මෙම ප්‍රසම්පාදනය සඳහා මැතිවරණ වියදම් වැය ශීර්ෂය යටතේ වැය කර තිබුණද මිලදී ගත් අරමුණ ඉටුවී නොතිබුණි.

**(iii) මුහුදු තැපැල් මළු විදේශ අන්තයන් වෙත ප්‍රවාහනය කිරීම**

------------------------------------------------------------

මුහුදු තැපැල් මළු විදේශ අන්තයන් වෙත ප්‍රවාහනය කිරීමට 2014 වර්ෂය සඳහා රු. 11,521,156 ක්ද 2015 අගෝස්තු මාසය දක්වා රු. 7,693,780 ක්ද, ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- 2015 වර්ෂය සඳහා මුහුදු තැපැල් මළු විදේශ අන්තයන් වෙත ප්‍රවාහනය කිරීමේ ප්‍රසම්පාදනය සඳහා 2014 වර්ෂයේ කොන්ත්‍රාත්තුව පිරිනැමූ ආයතනය ඇතුළුව ලංසු 05 ක් ඉදිරිපත් කර තිබුණි. දෙපාර්තමේන්තුව ඉල්ලා තිබුණු සුදුසුකම් හෝ පලපුරුද්ද සපුරා නොමැතිවීම හේතුවෙන් 2014 දෙසැම්බර් 19 දිනැති ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත එම ලංසු කැඳවීම අවලංගු කර 2014 වර්ෂයේ ප්‍රසම්පාදනය ලබාදුන් ආයතනයේ කාලය 2015 අප්‍රේල් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4(ඉ) මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසුකම් නොතිබීම විශාල බැහැර වීමක් ලෙස සලකා කටයුතු කළ යුතු වුවත්, 2014 වර්ෂයේදී මෙම ආයතනයට සුදුසුකම් නොතිබීම සුළු බැහැරවීමක් ලෙස සළකා කටයුතු කර තිබුණි. 2015 වර්ෂයේදී එම ආයතනයේ ලංසුව මූලික අදියරේම ප්‍රතික්ෂේප කර තිබුණි.

- සුදුසුකම් නොතිබීමට අමතරව බැංකු ඇපකරය තැපැල්පති නමින් ඉදිරිපත් නොකිරීම නිසා ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. එහෙත් එම ඇපකරය තැපැල්පති

නමින් ලබාගෙන නොමැති වුවත් එය ප්‍රසම්පාදන ගණකාධිකාරී නමින් ලබාගෙන තිබුණි. ඒ අනුව ඉදිරිපත් කර තිබූ ලංසු සුරක්ෂණය වලංගු සුරක්ෂණයක් විය.

- මෙම ආයතනය විසින් 2014 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ මිල ගණන්වලට වඩා 2015 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ මිල ගණන්වල එනම් කියුබික් මීටරයකට ගමනාන්ත 17 සඳහා එකතුව ඇ.එ.ඩො. 2,950 සිට ඇ.එ.ඩො. 2,670 දක්වා අඩුවීමක් සිදුවී තිබුණි. එසේ අඩුවූ මිල ගණන් පිළිබඳ නොසලකා පෙර වර්ෂයේ මිල ගණන්වලටම 2015 අප්‍රේල් 30 දින දක්වා කොන්ත්‍රාත්තුව දීර්ඝ කර තිබුණි.

- ඉහත ප්‍රසම්පාදනය අවලංගු කිරීම හේතුවෙන් 2015/2016 වර්ෂ සඳහා සුදුසු සේවා සැපයුම්කරුවකු තෝරා ගැනීමට 2015 මාර්තු 15 දින පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. ඒ සඳහා රු. 73,177 ක් ප්‍රවෘත්ති පත්‍ර සමාගමකට ගෙවා තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදීද පෙර සැපයුම්කරු සමඟ ආයතන 03 ක් විසින් මිල ගණන් එවා තිබුණ අතර එම ආයතන 03 කින් ඉල්ලා තිබූ මූලික සුදුසුකම් සපුරා නොතිබුණි. මේ අනුව මුහුදු තැපැල් මළු ප්‍රවාහනය සඳහා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලනු ලබන සුදුසුකම් සම්පූර්ණ කළ ලංසුකරුවන් දිගින් දිගටම ඉදිරිපත් නොවීම සම්බන්ධයෙන් හා එම සුදුසුකම් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- මුහුදු තැපැල් මළු විදේශ අන්තයන් වෙත ප්‍රවාහනය කිරීම සඳහා ආයතන තෝරා ගැනීමේදී දෙපාර්තමේන්තු තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් ඒ ඒ වර්ෂයන්වලදී ප්‍රමිතියකින් තොරව විවිධ නිර්නායක ඉදිරිපත් කරමින් ප්‍රතික්ෂේප කිරීම හා ආයතන තෝරා ගැනීම සිදුකර තිබුණි. ඒ අනුව මුහුදු තැපැල් මළු ප්‍රවාහනය කිරීමේ ප්‍රසම්පාදනයේදී රජයට වඩා වාසිදායක අයුරින් කටයුතු කර ඇති බවත්, නිරීක්ෂණය නොවූ අතර විධිමත් ආකාරයෙන් කොන්ත්‍රාත්කරු තෝරාගැනීමක් සිදුකරන බව විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

**(iv) තැපැල්කරුවන් සඳහා වැහි කබා 8,000 ක් මිලදී ගැනීම**

ජනාධිපතිවරණ ඡන්ද පත්‍රිකා බෙදාහැරීම අධික වර්ෂාව නිසා නොහැකි තත්ත්වයක් මත හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා රු. 8,800,000 ක් වැයකර වැහි කබා 8,000 ක් රාජ්‍ය සංස්ථාවකින් සෘජුව මිලදී ගෙන තිබුණි. 2014 දෙසැම්බර් 29 දින මිල ගණන් ලබාගෙන වැහි කබා 8,000 ක් 2014 දෙසැම්බර් 31 දින සිට 2015 ජනවාරි 31 දින දක්වා කාල පරාසය තුළ කොටස් 04 කින් ලැබෙන පරිදි ඇණවුම් කර තිබුණි. මැතිවරණ පැවැත්වීමට පෙර 2014 දෙසැම්බර් 31 දින වැහි කබා 423 ක් පමණක් සංස්ථාව විසින් සපයා තිබුණි. එදිනට එම වැහි කබා 148 ක් ප්‍රධාන තැපැල් අධිකාරී අම්පාරට නිකුත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ජනාධිපතිවරණ හදිසි අවශ්‍යතා ලෙස සලකා වැහි කබා 8,000 ක් ඇණවුම් කර තිබුණත්, ඉන් වැහි කබා 423 ක් පමණක් සංස්ථාව විසින් සපයා තිබීම නිසා වැහි කබා ලබාගැනීමේ අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව මිලදී ගැනීමේ වටිනාකම රු. 500,000 ඉක්මවන විටදී ගිවිසුමකට එළඹිය යුතු වුවත් මෙම ප්‍රසම්පාදනය සඳහා ගිවිසුමකට එළඹ නොතිබුණි.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේහය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

- තරඟකාරී මිල කැඳවීමකින් තොරව සිදුකරන ලද මෙම ප්‍රසම්පාදනයේ නැවත ඇණවුමක් ලෙස මැතිවරණ වියදම් ශීර්ෂය යටතේම තවත් වැහි කබා 2,000 ක් මිලදී ගැනීමට 2015 අප්‍රේල් 04 දින එම සංස්ථාවට පිරිනමා තිබුණි.

- නැවත ඇණවුම් කරන ලද වැහි කබා 2,000, 2015 අප්‍රේල් 30 දිනට ප්‍රථම සැපයිය යුතු වුවත් එම සැපයීමද 2015 මැයි 27 දින සිදුකර තිබුණි.

**(v) හණ ලණු කැරළි 4,000 ක් හා හණ ලණු බෝල 4,000 ක් මිලදී ගැනීම**

---

හණ ලණු කැරළි 4,000 ක් හා හණ ලණු බෝල 4,000 ක් මිලදී ගැනීම සඳහා රු. 2,804,000 ක් වැය කර තිබුණි. මෙහිදී හණ ලණු බෝල සඳහා කිලෝ 1 ක් සඳහා අවම මිල රු. 344.80 ක මිල ප්‍රතික්ෂේප කර රු. 364 බැගින් හණ ලණු බෝල 4,000 ක් රු. 1,456,000 කට මිලදී ගෙන තිබුණි. හණ ලණු බෝලවල ගුණත්වයෙන් අඩු වීම ලෙස දක්වා අවම මිල ප්‍රතික්ෂේප කර තිබුණි. නමුත් එහි ගුණත්වය පිළිබඳව ප්‍රමිතිය පරීක්ෂා කිරීමට දැනුමක් ඇති නිලධාරියෙකුගේ සහය ලබාගෙන නොතිබුණි.

**(vi) ආරක්ෂිත ප්ලාස්ටික් මුද්‍රා මිලදී ගැනීම**

---

ආරක්ෂිත ප්ලාස්ටික් මුද්‍රා මිලියන 03 ක් මිලදී ගැනීම සඳහා විවෘත මිල ගණන් යටතේ ලංසු කැඳවා තිබුණි. 2014 ජූලි 31 දින ලැබී තිබුණු ලංසු විවෘත කිරීම සිදුකර තිබුණද, තාක්ෂණික ඇගයීම් වාර්තාව මාස 03 ක ප්‍රමාදයකින් පසුව 2014 ඔක්තෝබර් 29 දින ලබා දී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනය සම්පූර්ණ කර භාණ්ඩ දෙපාර්තමේන්තුව වෙත ලබාගැනීමට මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණි. ප්‍රසම්පාදනය සඳහා ආයතන 21 කින් ලංසු ඉදිරිපත් කර තිබූ අතර ඉන් ආයතන 19 ක ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. ඉතිරි ආයතන 02 කින් අවම මිල රු. 6.83 ක් ලෙස ඉදිරිපත් කර තිබූ සමාගමේ ලංසුව ප්‍රතික්ෂේප කර රු. 8.30 බැගින් වූ ලංසුව ඉදිරිපත් කළ ආයතනයට 2014 නොවැම්බර් 07 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. දේශීය නිෂ්පාදකයින්ට ප්‍රමුඛස්ථානය දීම යන විධිවිධානය යටතේ ප්‍රසම්පාදනය මෙම සමාගමට පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.6 මාර්ගෝපදේශය ප්‍රකාරව ඉඩදිය හැකි සියයට 20 ගණනය කිරීම රජයට අවාසිදායක අයුරින් සිදුකර තිබුණි.

- 2015 අප්‍රේල් 07 දින වන විට ලබා දිය යුතු වූ 750,000 ක ආරක්ෂිත ප්ලාස්ටික් මුද්‍රා තොගයක් 2015 අප්‍රේල් 27 දින වන විටත් ලබා දී නොතිබුණි. එසේ තිබියදී රු.මිලියන 1.5 ක ඇණවුමක් 2015 අප්‍රේල් 27 දින එම ආයතනයට භාරදී තිබුණි. ඒ අනුව ආරක්ෂිත ප්ලාස්ටික් මුද්‍රා මිලියන 4.5 ක් රු. 6.83 බැගින් මිලදී ගැනීමට හැකියාව තිබියදී රු. 8.30 ට මිලදී ගැනීම නිසා රජයට රු. මිලියන 6.6 ක අලාභයක් සිදුවී තිබුණි.

**(vii)** **නිල ඇඳුම් රෙදි මිලට ගැනීම**

**-------------------------------**

2015 වර්ෂය සඳහා නිල ඇඳුම් රෙදි මිලදී ගැනීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් 09 දෙනෙකුගෙන් 2015 අප්‍රේල් 23 දින ලංසු කැඳවා තිබුණි. 2015 ජූලි 11 දින එනම් මාස 03 ක ප්‍රමාදයකින් පසුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය ලබාදී තිබුණි. ප්‍රසම්පාදනය අදාළ සැපයුම්කරුවන්ට 2015 අගෝස්තු 04 දින ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වර්ෂය ආරම්භ වීමට ප්‍රථම නිල ඇඳුම් රෙදි ලබා දිය යුතු වුවත්, 2015 වර්ෂයට අදාළ නිල ඇඳුම් රෙදි මාස 10 ක ප්‍රමාදයකින් පසුව සපයා තිබුණි.
- නිල ඇඳුම් රෙදි සපයා ගැනිම සඳහා අදාළ සැපයුම්කරු තෝරා ගැනීමේදී රෙදිවල පැවතිය යුතු ගුණාත්මකභාවය පිළිබඳව මිල ගණන් කැඳවන අවස්ථාව වන විට තීරණය කර නොතිබුණි. මේ නිසා සැපයුම්කරුවන් ඉදිරිපත් කළ එක් එක් ආදර්ශ මත ගුණාත්මකභාවය පරීක්ෂා කර නිල ඇඳුම් රෙදි සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණි.

**(viii)** **ඉමදූව තැපැල් කාර්යාල නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

**--------------------------------------------------------**

කුඩා නගර සංවර්ධනය කිරීමේ සැලැස්ම යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තැපැල් කාර්යාල නව ගොඩනැගිල්ලක් ඉදිකරන ලෙස කරන ලද නියෝජ්‍ය කථානායකවරයාගේ ඉල්ලීමට අනුව, ඉමදූව තැපැල් කාර්යාලය ඉදිකිරීමට තීරණය කර 2012 වර්ෂයේ තිරප්පනේ තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වෙන්කරන ලද රු. මිලියන 3 ක ප්‍රතිපාදන මුදලින් මෙම තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට 2012 දෙසැම්බර් 31 දින රු. මිලියන 3 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ගෙවීම් කිරීමට පෙර භූමිය පරීක්ෂා කර නොතිබුණි.

- ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2013 මාර්තු 06 දිනැති ලිපිය අනුව යෝජිත භූමියෙහි ජලය ගලා ඒම සඳහා කානු පද්ධතියක් සැකසීම, රැඳවුම් බැම් ඉදිකිරීම, අස්ථාවර පාංශු ස්තරය ස්ථාවර කිරීම ආදිය සඳහා අධික වියදමක් සිදුකළ යුතුව තිබුණි. යෝජිත තැපැල් කාර්යාලය ඉදිකිරීම මූල්‍යමය වශයෙන් යෝග්‍ය නොවන බව මෙමගින් යෝජනා කර ඉදිකිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් සිදු කර නොතිබුණි. එසේ වුවද ඉහත ගෙවන ලද රු. මිලියන 3 ක් ආපසු අයකර ගෙන නොතිබුණි.

- මෙම ඉදිකිරීම සිදුකිරීමට යෝජිත ඉඩම අයෝග්‍ය බවට යෝජනා කර තිබුණද, 2014 දෙසැම්බර් 23 දින තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය හා තැපැල් දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි.

- ඉඩමේ පිරිවැයද සමඟ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම රු.8,587,965 ක් වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. 1,717,593 ක් ගෙවිය හැකි වුවත්, ඊට පටහැනිව එම අධිකාරියට 2014 දෙසැම්බර් 31 දින රු.8,000,000 ක් ගෙවා තිබුණි.

- දෙපාර්ශවය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුමේ 03 වන කොන්දේසිය අනුව රු. 587,965 ක ඉතිරි මුදල ගෙවිය යුතු වන්නේ ව්‍යාපෘතිය නිමකර අවශ්‍ය සියළුම අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව ඉඩම සමඟ නීත්‍යානුකූලව පවරන අවස්ථාවේ වුවද, ඉඩම නීත්‍යානුකූලව පවරා නොගෙන ඉතිරි මුදල 2015 ඔක්තෝබර් 20 දින ගෙවා තිබුණි.

- අඩුපාඩු සහිතව 2015 නොවැම්බර් 21 දින තැපැල් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කර තිබුණි.

### 3.12 පාඩු හා හානි

--------------

නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2015 ජනවාරි 09 දින සිට 2015 දෙසැම්බර් 30 දින දක්වා කාලය තුළදී සිදුවූ රථ වාහන අනතුරු 27 ක් සඳහා අලාභයන් තක්සේරු කර නොතිබුණි.

(ආ) වත්තල තැපැල් කාර්යාලයේ පාඩු හානි වශයෙන් 1998 ජනවාරි 01 දින සිට පැවත එන රු. 3,861,791 ක් නිරවුල් නොකළ මූල්‍ය අලාභයක් දෛනික මුදල් ගිණුමෙහි දිගින් දිගටම පෙන්වා තිබුණ අතර 2015 දෙසැම්බර් 31 දින වන විටත් එය නිරවුල් කර නොතිබුණි.

(ඇ) නාරාහේන්පිට මුද්දර ගබඩාවේ 2015 දෙසැම්බර් 31 දිනට රු. 7,196,150 ක් වටිනා මුද්දර ඌනතාවයක් වූ අතර එය නිරවුල් කර නොතිබුණි.

(ඈ) පළුදු හා මුද්‍රණ දෝෂ මත ප්‍රතික්ෂේප කර තිබූ රු. 837,050 ක් වටිනා මුද්දර තොගයක් ගබඩාවේ පැවති අතර එම මුද්දර තොගය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.13 අනාර්ථික ගනුදෙනු

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) තැපැල් දෙපාර්තමේන්තුවේ වරිපනම් ප්‍රමාද කර ගෙවා තිබුණි. වැතැම් වීදිය හා ලෝටස් පාර තැපැල් කාර්යාලවල 1996 වර්ෂයේ සිට හිඟව පැවති වරිපනම් හා ඇල්විටිගල මාවත තැපැල් කාර්යාලයේ 2007 වර්ෂයේ සිට වරිපනම් 2015 වර්ෂයේදී ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසය වනවිට හිඟ වරිපනම් බදු වශයෙන් රු. 6,962,039 ක් කොළඹ නගර සභාව වෙත ගෙවා තිබුණි. වරිපනම් ගෙවීමේදී සෑම වර්ෂයකම වරිපනම් ජනවාරි 31 දිනට පෙර ගෙවීමෙන් සියයට 10 ක වට්ටම් වාසියක් ලබා ගත හැකිව තිබුණත්, එසේ නොකිරීමෙන් රු.696,204 ක වට්ටම් වාසිය අහිමි වී තිබුණි.

(ඇ) තැපැල් දෙපාර්තමේන්තුවේ තිරප්පනේ නව තැපැල් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු. 210,152 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබියදී, එම ඉදිකිරීම නතර කිරීම නිසා ගෙවූ මුදල නිෂ්ඵල වී තිබුණි.

## 3.14 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

### (අ) මුදල් ඇණවුම් සේවා ගිණුම - 2014

--------------------------------------

දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති MORS හා E-pay මෘදුකාංගවල දුර්වලතාවයක් පැවතීම නිසා මුදල් ඇණවුම් ගිණුමේ පහත සඳහන් දුර්වලතා අනාවරණය විය.

(i) 2014 වර්ෂයේ සියළුම මුදල් ඇණවුම් නිකුත් කිරීම් හා ගෙවීම් පරිගණකයට ඇතුළත් නොකිරීම නිසා පරිගණක ගත මුදල් ඇණවුම් නිකුත් කිරීම්, ගෙවීම් හා කොමිස් ආදායම භාවිතා කළ නොහැකි විය.

(ii) පරිගණක පහසුකම් නැති උප තැපැල් කාර්යාලවල මුදල් ඇණවුම් පිළිබඳ දත්ත, පාලන කාර්යාලයට හෝ දිසා ගණකාධිකාරී කාර්යාලවලට කලට වේලාවට ඉදිරිපත් නොකරීම නිසා ඒවා පරිගණකයට ඇතුළත් කිරීමට ප්‍රමාද වී තිබුණි.

(iii) දෛනික මුදල් ඇණවුම් වාර්තාව නියමිත වෙලාවට ලබා ගැනීමට නොහැකි වීම, ඒ සඳහා අනවශ්‍ය කාලයක් වැයවීම හා ප.ව. 2.00 න් පසුව බොහෝ විට වාර්තාව ලබාගැනීමට නොහැකි වීම හෝ දෛනික මුදල් වාර්තාව සඳහා මුදල් ඇණවුම් වාර්තාව දෛනිකව දිසා ගිණුම් කාර්යාලය වෙත යැවීමට නොහැකි වීම.

(iv) සමහර අවස්ථාවල තහවුරු කරන ලද මුදල් ඇණවුම් පද්ධතියට ඇතුළත් කිරීමට නොහැකි වීම.

(v) මෘදුකාංගයට මුදල් ඇණවුම් ලැබීම්, ගෙවීම් ඇතුළත් කළද සාරාංශ වාර්තාවේ එය පෙන්නුම් නොකිරීම.

(vi) දිසා ගිණුම් කාර්යාලවලදී ගෙවන කොමිස් මුදල් පිළිබඳ සාරාංශයක් ලබාගැනීමට නොහැකි වීම.

(vii) මුදල් ඇණවුම් නිකුත් කිරීම්, මුදල් ඇණවුම් ගෙවීම් හා මුදල් ඇණවුම් කොමිස් ආදායම දෙපාර්තමේන්තු පරිගණක මෘදුකාංග මගින් ලබාගෙන තිබූ ශේෂයන්, මුදල් ඇණවුම් ගිණුම සැසඳුම් ප්‍රකාශයට අනුව විශාල වෙනස්කම් ඇති වී තිබීම.

ඉහතින් දක්වා ඇති හේතු නිසා පරිගණක මෘදුකාංගය මගින් ලබා ගෙන තිබුණු තොරතුරු නිවැරදි වී නොතිබුණි. 2014 වර්ෂයේදීද මුදල් ඇණවුම් ගිණුම් සැසඳුම් සකස් කිරීමේදී, දිසා ගිණුම් සාරාංශ අනුව සකස් කළ ගිණුම් සාරාංශ හා පොත් තැබීම් අංශයෙන් භාණ්ඩාගාරයට වාර්තා කළ මුදල් ඇණවුම් මාසික ගිණුම් සාරාංශ පදනම් කරගෙන මුදල් ඇණවුම් සේවා ගිණුම සකස් කර තිබුණි.

**(ආ) වත්තල තැපැල් කාර්යාලයේ පරීක්ෂණය**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තැපැල්පතිගේ 2013 ජූනි 13 දිනැති හා අංක 1/2006 දරන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව වත්තල තැපැල් කාර්යාලයේ තැපැල් ස්ථානාධිපති විසින් අනුමත මුදල් සීමාව රු. 150,000 ඉක්මවා 2015 ජූනි මාසය තුළ පමණක් රු. 82,000 ක සිට රු. 2,593,000 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් අතිරික්ත මුදල් පවත්වා තිබුණි. තවද ගම්පහ දිසා ගිණුම් කාර්යාලය විසින් 2015 ජූනි 25 දින වැටුප් ගෙවීම් සඳහා රු. 766,258 ක් වටිනා චෙක්පතක් නිකුත් කර තිබුණද, එය මුදල් කර ගැනීමකින් තොරව අතැති මුදල්වලින් වැටුප් ගෙවා තිබුණි.

(ii) මුද්දරවලින් ලැබෙන ආදායම දෛනිකව ප්‍රේෂණය කර නොතිබුණ අතර 2015 ජූනි 25 දින වනවිට මුද්දරවලින් ලැබූ ආදායම ලෙස රු. 186,365 ක් තැපැල් ස්ථානාධිපති භාරයේ පැවතුණි.

(iii) දෛනික මුදල් ගිණුම දිනපතා පිළියෙල කර තුලනය කළ යුතු වුවත්, 2015 ජූනි 24 දින දෛනික මුදල් ගිණුම (cash sheet) විගණන දිනය වූ 2015 ජූනි 25 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) වාහන පාලනය**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) යුධ සමයේදී යාපනයේදී අතුරුදන් වූ බවට සටහන් කර තිබූ වාහන 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව 2016 ජූලි 26 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) තැපැල් දෙපාර්තමේන්තුවේ මූලස්ථාන නිලධාරීන්ගේ රාජකාරී සඳහා සංචිත වාහන ලබාදෙනු වෙනුවට නිලධාරීන් 08 දෙනෙකු වෙනුවෙන් වාහනය බැගින් වෙන්කර ඉන්ධන සීමාවක් අනුමත කර තිබුණි. මේ අනුව ඒ ඒ නිලධාරීන්ගේ අභිමතය පරිදි වාහන පාවිච්චි කිරීමට ඉඩකඩ සලසා දී තිබුණි.

**(ඈ) සන්නිවේදන පියස**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ''සන්නිවේදන පියස'' (තැපැල් සාප්පු) ප්‍රධාන තැපැල් කාර්යාල ආශ්‍රිතව පිහිටුවා තිබුණද, සන්නිවේදන පියස්හි ක්‍රියාත්මක තත්ත්වය පිළිබඳ පරීක්ෂාවේදී, පිහිටුවා තිබූ තැපැල් සාප්පු 91 කින් 2016 මාර්තු 29 දින වන විට සාප්පු 45 ක් අක්‍රීය තත්ත්වයේ පැවැතිණි.

(ii) සන්නිවේදන පියසට ලැබෙන අලෙවි ආදායම ප්‍රධාන මුදල් අයකැමිට දෛනිකව ප්‍රේෂණය කළ යුතු වුවත් මාතර සන්නිවේදන පියසේ 2012 අගෝස්තු මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාලය තුළ රු. 268,701 ක ලැබීම් ප්‍රේෂණය කර නොතිබුණි. මෙම මුදල් අයකර ගැනීමට 2016 මැයි 26 දින දක්වා කටයුතු කර නොතිබුණු අතර එක් නිලධාරියකු 2015 මාර්තු මාසයේ විශ්‍රාම ලබා සිටි අතර විශ්‍රාම පාරිතෝෂිත මුදල ගෙවීමට පෙර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2013 මැයි 09 දින සන්නිවේදන පියසෙහි රාජකාරි භාරගත් තැපැල් සේවා නිලධාරිණියට කලින් සේවය කළ නිලධාරියා විසින් ලබාදුන් රු. 83,942 ක් ප්‍රේෂණය කිරීමට මාස 03 ක වැඩි කාලයක් පමා කර තිබුණි.

(iv) තවද සන්නිවේදන පියසෙහි අලෙවි ආදායමේ ලැබීම් එදිනෙදා ප්‍රේෂණය නොකර ප්‍රමාද වී ප්‍රේෂණය කිරීම තුළින් රාජ්‍ය මුදල් අයථා පරිහරණය කිරීමට ඉඩ සලසා තිබුණි. එසේම මාස 01 ක සිට මාස 07 ක් දක්වා කාලයක් ප්‍රමාද කර රු.1,295,885 ක් ප්‍රේෂණය කර තිබුණි.

**(ඉ) අතිකාල දීමනා ගෙවීම**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 3.2 වගන්තියට පටහැනිව රාජකාරි වේලාව තුළ වැඩ කිරීම වෙනුවෙන් පීඩන හා අතිකාල ආවරණ ලෙස සලකා නිලධාරීන්ට අතිකාල දීමනා ගෙවා තිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 3.5 වගන්තිය ප්‍රකාරව යම්කිසි දෙපාර්තමේන්තුවක නිතිපතාම අතිකාල වැඩ තිබෙන අවස්ථාවකදී අභ්‍යන්තර වැඩපිළිවෙලක් යෙදීමෙන් හෝ අතිරේක කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමෙන් හෝ අතිකාල දීමනා ගෙවීම වලක්වා ගැනිම සඳහා පරිවර්තිත අතිකාල දීමනාවක් නියම කරන ලෙස ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලා සිටිය හැකි වුවත්, දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු නොකර අනියම් ගාස්තු ප්‍රමාණයන් අනුව අතිකාල දීමනා ගෙවා තිබුණි.

(iii) ඉහත පරිච්ඡේදයේ 3.6 වගන්තියට අනුව නිලධාරියකු නිවාඩු ගිය නිසාම නැතහොත් තනතුර පුරප්පාඩු වූ පමණින්ම එම තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා අතිකාල ගෙවීම අනුමත නොකළ යුතු වුවත්, තැපැල් දෙපාර්තමේන්තුව විසින් පුරප්පාඩු අතිකාල හා ආවරණ අතිකාල ලෙස දිගින් දිගටම අතිකාල දීමනා ගෙවා තිබුණි.

(iv) ඉහත පරිච්ඡේදයේ 6.1 වගන්තියට අනුව පැයකට ගෙවිය යුතු සාමාන්‍ය අතිකාල දීමනා ප්‍රමාණය දිනක වැටුපෙන් 1/8 කි. මාසික වැටුප් ලබන නිලධාරියකු සම්බන්ධයෙන් දිනක වැටුප ගණන් බැලිය යුත්තේ ඒකාබද්ධ මාසික වැටුපෙන් 1/30 ක් වශයෙන් වුවත්, තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයන් සඳහා අතිකාල පැය ගණනට සියයට 25 ක් එකතුකර ප්‍රසාද අතිකාල වශයෙන් දීමනාවක් ගෙවා තිබුණි.

(v) ඉහත පරිච්ඡේදයේ 7.1 හා 7.2 වගන්තිවලට අනුව පුරප්පාඩු වූ තනතුරක රාජකාරී ආවරණය කිරීම සඳහා ඉටු කරන අතිකාල වැඩද ඇතුළුව මසකට පැය 20 ට වැඩි අතිකාල දීමනා නොගෙවිය යුතු බව හා අති විශේෂ අවස්ථාවලදී ඒ සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. එවැනි විශේෂ අනුමැතියක් නොමැතිව මුදල් රෙගුලාසි 135 හි බලය පැවරීම මත පැය 40, 60, 80, හා 120 ආදී වශයෙන් අතිකාල දීමනා ගෙවා තිබුණි. නියෝජ්‍ය තැපැල්පති, ප්‍රධාන ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක ආදී නිලධාරීන්ද අතිකාල ලබාදීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

(vi) තොරතුරු තාක්ෂණ අංශයේ 2015 ජනවාරි මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා නිලධාරීන් 12 ක සිට 17 ක් දක්වා පරාසයක කණ්ඩායමක් සඳහා එකතුව රු. 878,743 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. මෙහිදී නිලධාරීන් 06 දෙනෙකු අවස්ථා 23 කදී අසාමාන්‍ය ලෙස දින 02 හා දින 03 ක් සේවය කළ බවට සටහන් යොදා අතිකාල ලබාගෙන තිබුණි.

(vii) තැපැල් මූලස්ථානයේ මැතිවරණ රාජකාරී සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ දීමනා හා ගමන් වියදම් වවුචර් පත් පරීක්ෂා කිරීම, ඒ වෙනුවෙන් ගෙවීම් කටයුතු සඳහා අත්තිකාරම් වශයෙන් චෙක්පත් නිකුත් කිරීම හා අධීක්ෂණ කටයුතු සිය දෛනික රාජකාරියට අමතරව ඉටුකිරීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් තැබීමකින් තොරව අතිකාල දීමනා ගෙවීම අනුමත කර තිබුණ අතර ඒ අනුව ගෙවීම් සිදුකර තිබුණි. ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර එම සටහන් අනුව වැඩ කළ අමතර පැය ගණනට අතිකාල දීමනා ගෙවිය යුතු වුවත්, මෙවැනි අනුමැතියක් ලබාදීම තුළින් අමතර පැය ගණන ගණනය නොකර රාජකාරී කාලය තුළදීම අතිකාල දීමනා ලබාගැනීමට ඉඩකඩ සලසා තිබුණි.

**3.16 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යා පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 121 | 87 | 34 | - |
| (ii) | තෘතීයික මට්ටම | 147 | 55 | 92 | - |
| (iii) | ද්විතීක මට්ටම | 8,854 | 7,529 | 1,325 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17,659 | 16,728 | 931 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 08 | - | 08 |
| | **එකතුව** | **26,781** | **24,407** | **2,382** | **08** |